තෙවන සතිය

තෙවන සැසිය

# රාජ්‍ය ආදායම

All Rights Reserved © 2023
Verité Research

# සාකච්ඡාවට බඳුන් කෙරෙන ක්ෂේත්‍ර

1. රාජ්‍ය ආදායම පිළිබඳ කෙටි සමාලෝචනයක්

    1.1 රාජ්‍ය ආදායමෙහි සංයුතිය
    1.2 වසර කිහිපයක් තුළ රාජ්‍ය ආදායම් ප්‍රවණතා
    1.3 රටවල් කිහිපයක් පාදක සංසන්දනාත්මක විග්‍රහය

2. රාජ්‍ය ආදායම හා සබැඳි ගැටලු

3. 2023 විස්තීර්ණ ණය පහසුකම යටතේ නියමිත ආදායම් උත්පාදන යෝජනා

All Rights Reserved © 2023
Verité Research

# 1.1 රාජ්‍ය ආදායමෙහි සංයුතිය

All Rights Reserved © 2023
Verité Research

# සෘජු හා වක්‍ර බදු යන්නෙන් කුමක් අදහස් වේද?

## සෘජු බදු

- තනි පුද්ගලයන් හෝ සමාගම් වෙතින් සෘජුවම අය කරනු ලැබෙන සහ ආදායම, ධනය ආදිය මත පදනම් වන බදු
- සෘජු බදුවලට නිදසුන්: පුද්ගලික ආදායම් බදු, සාංගමික බදු, පොලී ආදායම මත බදු, ලාභාංශ ආදායම මත බදු, ප්‍රාග්ධන ආදායම මත බදු

## වක්‍ර බදු

- වෙනත් පාර්ශ්වයක් (උදා:- පාරිභෝගිකයා) වෙත බදු ආරෝපණය කරනු ලබන එක් පාර්ශ්වයක් (නිෂ්පාදකයන්, සිල්ලර වෙළෙන්දන්, ආනයනකරුවන්) වෙතින් සාමාන්‍යයෙන් අය කරනු ලැබෙන බදු
- වක්‍ර බදුවලට නිදසුන්: වැට්, සුරාබදු, රේගු බදු, විශේෂ වෙළඳ භාණ්ඩ බදු, සෙස් බදු, වරාය හා ගුවන්තොටුපල සංවර්ධන බදු

**අනුක්‍රමික බදු:** මුදල් වටිනාකම විශාල වන විට බදු අනුපාතය ඉහළ යන බදු වර්ගයකි.

**ප්‍රතික්‍රමික බදු :** මෙහිදී දුගී ජනතාව තම ආදායමෙන් පොහොසත් ජනතාවට වඩා වැඩි ප්‍රතිශතයක් ගෙවයි


සාධාරණමය (equity) පැතිකඩකින් බැලූ කල සෘජු බදු සාමාන්‍යයෙන් **අනුක්‍රමික** ස්වභාවයක් ගන්නා බව සැලකේ.

කෙසේ වෙතත්, ඇතැම් වක්‍ර බදු මඟින්ද සාධාරණතාව ප්‍රවර්ධනය විය හැක. උදා:- සුබෝපභෝගී වාහන හා සුබෝපභෝගී නිෂ්පාදන මත බදු.

All Rights Reserved © 2023
Verité Research

# සාමාන්‍යයක් ලෙස ගත් කල ශ්‍රී ලංකාවේ මුළු බදු ආදායමෙන් **81%ක් වක්‍ර බදු** ආදායම් වේ

සෘජු හා වක්‍ර බදු ආදායම





මූලාශ්‍ර: මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තා

සටහන: ආදායම/ලාභ මත බදු හැර අන් සියලුම වක්‍ර බදු, වක්‍ර බදුවලට ඇතුළත් වන අතර, සෘජු බදුවලට ආදායම මත බදු ඇතුළත් වේ.

All Rights Reserved © 2023
Verité Research

# 2023 වර්ෂයේ අපේක්ශිත බදු ආදායම් වර්ධනය 4%ක් පමණි




මූලාශ්‍රය: 2023 අනුමත අයවැය ඇස්තමේන්තු | ශ්‍රී ලංකා මහ බැංකුවේ 2022 වාර්ෂික වාර්තාව


All Rights Reserved © 2023
Verité Research

# බදු වර්ග


■ සෘජු බදු ■ වක්‍ර බදු

| ලාභ හා ආදායම මත බදු | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | බලපත්‍ර බදු හා වෙනත් | භාණ්ඩ හා සේවා මත බදු |
|---|---|---|---|
| ▪ පුද්ගල ආදායම් බද්ද<br>▪ සාමූහික බදු (සාංගමික බදු)<br>▪ රඳවා ගැනීමේ බද්ද<br>▪ ආර්ථික සේවා ගාස්තු<br>▪ ප්‍රාග්ධන ලාභ බද්ද | ▪ ආනයන බදු<br>▪ අපනයන බදු<br>▪ වරාය හා ගුවන්තොටුපොල සංවර්ධන බද්ද<br>▪ සෙස් අයබදු<br>▪ ආනයන හා අපනයන බලපත්‍ර ගාස්තු | ▪ සුඛෝපභෝගී මෝටර් රථවාහන මත බදු<br>▪ ඔට්ටු සහ සූදු බදු | ▪ එකතු කළ අගය මත බදු (වැට්)<br>▪ සුරාබදු<br>▪ විශේෂ වෙළඳ භාණ්ඩ බදු<br>▪ දුම්කොළ බද්ද<br>▪ සමාජ සුරක්ෂිතතා දායකත්ව බද්ද |
| **එකතුව (2022) : රු. බිලියන 559.3 - බදු ආදායමෙන් 31.9%** | **එකතුව (2022) : රු. බිලියන 303.9 - බදු ආදායමෙන් 17.4%** | **එකතුව (2022) : රු. බිලියන 6.6 - බදු ආදායමෙන් 0.4%** | **එකතුව (2022) : රු. බිලියන 881.5 - බදු ආදායමෙන් 50.3%** |

මූලාශ්‍රය: මුදල් අමාත්‍යාංශය - 2022

All Rights Reserved © 2023
Verité Research

# බදු ආදායම කෙරෙහි වැඩිම දායකත්වයක් ලැබී ඇත්තේ ආනයන පාදක බදු වෙතිනි






මූලාශ්‍රය: මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තා

All Rights Reserved © 2023
Verité Research

# 2022 වසර තුළ රාජ්‍ය ආදායම ඉහළ යාමෙන්, 67% ක් සාංගමික ආදායම් බද්ද හා වැට් බදු ඉහළ දැමීම හේතුවෙන් සිදුවිය

මුළු ආදායම හා ප්‍රදාන
(රුපියල් බිලියනවලින්)





මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුවේ 2022 වාර්ෂික වාර්තාව

All Rights Reserved © 2023
Verité Research

# 1.2 රාජ්‍ය ආදායම් ප්‍රවණතා

All Rights Reserved © 2023
Verité Research


# 2015 සිට 2023 දක්වා රාජ්‍ය ආදායම ට්‍රිලියන 1.9කින් පමණක් ඉහළ ගියද රජයේ වියදම් ට්‍රිලියන 3.5කින් ඉහළ ගොස් ඇත




මූලාශ්‍රය: 2023 අනුමත අයවැය ඇස්තමේන්තු | ශ්‍රී ලංකා මහ බැංකුවේ 2022 වාර්ෂික වාර්තාව

© 2023 Verité Research.
All Rights Reserved.


# 2016 වසරේ සිට රාජ්‍ය ආදායම ද.දේ. නි. හි ප්‍රතිශතයක් ලෙස පහත බැස තිබේ




මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව, වාර්ෂික වාර්තාව (2022) | 2023 සඳහා අනුමත අයවැය ඇස්තමේන්තු

All Rights Reserved © 2023
Verité Research

# ආනයන පාදක බදු ආදායම සාමාන්‍යයෙන් ලෙස මුළු බදු ආදායමෙන් **40-50%**ක් වෙත දායකත්වය ලබා දුන් අතර, ප්‍රථම වතාවට **2022** වසරේදී එය **34%** දක්වා පහත බසින ලදි




| | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| බලපත්‍ර ගාස්තු හා වෙනත් | 3% | 3% | 4% | 3% | 3% | 3% | 3% | 4% | 2% | 2% | 2% |
| ආනයන පාදක බදු | 51% | 49% | 49% | 52% | 50% | 49% | 47% | 41% | 45% | 42% | 34% |
| ගෘහස්ථ පරිභෝජන පාදක බදු | 27% | 27% | 28% | 26% | 29% | 32% | 32% | 31% | 30% | 32% | 32% |
| ආදායම් බදු | 19% | 20% | 19% | 19% | 18% | 16% | 18% | 25% | 22% | 23% | 30% |

මූලාශ්‍රය: මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තා


All Rights Reserved © 2023
Verité Research

# 1.3 රටවල් කිහිපයක් පාදක සංසන්දනාත්මක විග්‍රහය

All Rights Reserved © 2023
Verité Research

# කලාපය තුළ ද.දේ.නි. ට සාපේක්ෂව අඩුම ආදායමක් ඇති රට වන්නේ ශ්‍රී ලංකාවයි

**ද.දේ.නි. හි %ක් ලෙස ආදායම (2012 සිට 2021 දක්වා වසර 10ක කාලය පදනම්ව)**




මධ්‍යම ආදායම්ලාභී රටවල් පිළිබඳ ලෝක බැංකු දත්ත පදනම්ව


ද.දේ.නි. හි %ක් ලෙස වසර 10ක (2012-2021) ආදායම් සාමාන්‍යය = **17.26 %***

මූලාශ්‍රය: ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක ආර්ථික ඉදිරි දැක්ම දත්ත පදනම - අප්‍රේල් 2023

* සටහන: මෙම අගයයන් මගින් රටවල් 09 හි ම ආදායම් සාමාන්‍යය දැක්වේ

All Rights Reserved © 2023
Verité Research

# පොදුවේ ගත් කල දකුණු ආසියාතික රටවල් බොහොමයක ද.දේ.නි. ට සාපේක්ෂ බදු ආදායම, ඒක පුද්ගල ආදායම ද.දේ.නි සමග ඉහළ යයි





මූලාශ්‍රය: ලෝක බැංකු විවෘත දත්ත

All Rights Reserved © 2023
Verité Research

# එහෙත් ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල ද.දේ.නි.ය ඉහළ යන විට බදු ආදායම (ද්.දෙ.නි. යේ % ලෙස) පහළ ගොස් ඇත

## ශ්‍රී ලංකාව





මූලාශ්‍ර: ලෝක බැංකු විවෘත දත්ත | ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තා

All Rights Reserved © 2023
Verité Research

# ශ්‍රී ලංකාවට වඩා අඩු ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතයක් සහිත රටවල් 2021 දී ද.දේ.නි. ට සාපේක්ෂව ඉහළ ආදායමක් වාර්තා කොට ඇත

## 2021 වසර සඳහා රටවල් කිහිපයක ඒක පුද්ගල ද.දේ.නි. සහ ආදායම ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස




All Rights Reserved © 2023
Verité Research

මූලාශ්‍රය: ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක ආර්ථික ඉදිරි දැක්ම දත්ත පදනම - අප්‍රේල් 2023

# 2. රාජ්‍ය ආදායම හා සබැඳි ගැටලු


2.1 දුර්වල ඇස්තමේන්තුකරණය

2.2 බදුකරණය ආශ්‍රිත ගැටලු

- 2.2.1 නිරන්තර බදු වෙනස් කිරීම්
- 2.2.2 බදු පදනම බිඳ වැටීම
- 2.2.3 අධික බදු සහන ලබා දීම

# ගත වූ 17 වසර තුළ ශ්‍රී ලංකාව දිගින් දිගටම සිය ආදායම් ඉලක්ක සපුරා ගැනීමට අපොහොසත් වී ඇත

*ද.දේ.නි. හි %ක් ලෙස*





මූලාශ්‍ර: අයවැය කතාවල විවිධ සංස්කරණ/අනුවාද

All Rights Reserved © 2023
Verité Research

# ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ආදායම් ඉලක්ක සපුරා ඇත්තේ අවස්ථා 12කින් 3ක දී පමණි

## ජා.මූ.අ. ඉලක්කවලට සාපේක්ෂ සත්‍ය ආදායම්




මූලාශ්‍ර: රටවල් සඳහා නිකුත් කෙරෙන ජා.මූ.අ. වාර්තා | ශ්‍රී ලංකා මහ බැංකුව | Publicfinance.lk

All Rights Reserved © 2023
Verité Research

# ආදායම පුරෝකථනය කිරීමේදී මුදල් අමාත්‍යාංශයට වඩා සඵලදායී කර්තව්‍යයක් රජයේ මුදල් පිළිබඳ කාරක සභාව (ර.මු.පි.කා.ස.) විසින් ඉටු කරන ලදී

| | 2017 සඳහා මුදල් අමාත්‍යාංශයේ පුරෝකථන | 2017 වසර සඳහා රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ නිරීක්ෂණ | 2017 වසර සඳහා පුරෝකථනය කළ ආදායම | අධි පුරෝකථනය | | ඇස්තමේන්තුව |
|---|---|---|---|---|---|---|
| | | | | මුදල් අමාත්‍යාංශය | රජයේ මුදල් පිළිබඳ කාරක සභාව | ඉහළ නිරවද්‍යතාව |
| ***මුළු ආදායම (පළාත් සභා ඇතුළුව, ප්‍රදානයන් හැර)*** | ***2,088*** | ***1,962*** | ***1,989*** | ***5.0%*** | ***-1.4%*** | ර.මු.පි.කා.ස. |
| ***මුළු ආදායම (පළාත් සභා සහ ප්‍රදානයන් හැර)*** | ***2010*** | ***1,884*** | ***1,901*** | ***5.7%*** | ***-0.9%*** | ර.මු.පි.කා.ස. |
| **බදු ආදායම** | 1,821 | 1,695 | 1,749 | 4.1% | -3.1% | ර.මු.පි.කා.ස. |
| ආදායම් බදු | 335 | 297 | 308 | 8.8% | -3.6% | ර.මු.පි.කා.ස. |
| සාංගමික බදු | 158 | 132 | 150 | 5.3% | -12.0% | මුදල් අමාත්‍යාංශය |
| උපයන විට ගෙවීමේ බද්ද | 51 | 39 | 35 | 45.7% | 11.4% | ර.මු.පි.කා.ස. |
| රඳවා තැබීමේ බද්ද | 84 | අදාළ නොවේ | 60 | 40.0% | අදාළ නොවේ | අදාළ නොවේ |
| **භාණ්ඩ හා සේවා මත බදු** | 1,086 | 1,038 | 1,054 | 3.0% | -1.5% | ර.මු.පි.කා.ස. |
| එකතු කළ අගය මත බදු | 380 | 390 | 450 | -15.6% | -13.3% | ර.මු.පි.කා.ස. |
| සුරාබදු | 575 | 517 | 481 | 19.5% | 7.5% | ර.මු.පි.කා.ස. |
| මත්පැන් | 180 | 158 | 115 | 56.5% | 37.4% | ර.මු.පි.කා.ස. |
| දුම්වැටි | 105 | අදාළ නොවේ | 85 | 23.5% | අදාළ නොවේ | අදාළ නොවේ |
| මෝටර් රථ වාහන | 230 | 194 | 200 | 15.0% | -3.0% | ර.මු.පි.කා.ස. |
| ඛනිජ තෙල් | 55 | අදාළ නොවේ | 75 | -26.7% | අදාළ නොවේ | අදාළ නොවේ |
| වෙනත් | 5 | අදාළ නොවේ | 6 | -16.7% | අදාළ නොවේ | අදාළ නොවේ |
| **බාහිර වෙළඳාම මත බදු** | 400 | 360 | 387 | 3.4% | -7.0% | මුදල් අමාත්‍යාංශය |
| ආනයන හා සෙස් බදු | 225 | 200 | 217 | 3.7% | -7.8% | මුදල් අමාත්‍යාංශය |
| වරාය හා ගුවන් තොටුපල සං. බද්ද හා විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද | 175 | 160 | 170 | 2.9% | -5.9% | මුදල් අමාත්‍යාංශය |
| **බදු නොවන ආදායම** | 189 | අදාළ නොවේ | 152 | 24.3% | අදාළ නොවේ | අදාළ නොවේ |
| **පළාත් සභා** | 78 | අදාළ නොවේ | 88 | -11.4% | අදාළ නොවේ | අදාළ නොවේ |

මූලාශ්‍රය: රජයේ මුදල් පිළිබඳ කාරක සභාව - 1 වාර්තාව


All Rights Reserved © 2023
Verité Research

# 2023 සඳහා නිවැරදි අගයයන් පුරෝකථනය කරනුයේ කවුරුන්ද?

**2023 1 කාර්තුව**


ජා.මූ. අ. බදු ආදායම් ඉලක්කය: රු. බිලියන 650

සත්‍ය බදු ආදායම: රු. බිලියන 578




All Rights Reserved © 2023
Verité Research


# බදු ව්‍යුහය නිරන්තර වෙනස් කිරීම්වලට ලක් කිරීමෙන් බදු ක්‍රමයෙහි විශ්වසනීයත්වයට හා ස්ථායීතාවට බලපෑම් එල්ල වේ




All Rights Reserved © 2023

# 2010 වසරේ සිට වැට් බදු අනුපාතය 06 වරක් සංශෝධනය කර තිබේ

**2022 වසරේ ගැලපීම්**
පළමු මාස 6 - 8%
1 මාසය – 12%
අවසන් මාස 5 - 15%





මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

All Rights Reserved © 2023
Verité Research

**2.2.1** ගැටලුව: නිරන්තර බදු වෙනස් කිරීම්

## 2010 වසරේ සිට පුද්ගල ආදායම් බදු අනුපාතය 7 වරක් සංශෝධනය කර තිබේ; මෙවැනි නිරන්තර වෙනස් කිරීම් හේතුවෙන් බදු ව්‍යුහයෙහි විශ්වසනීයත්වයට හා ස්ථායීතාවට බලපෑම් එල්ල වේ

පුද්ගල ආදායම් බදු නිර්ණායක - පුද්ගල ආදායම් බද්දෙන් නිදහස් කිරීමේ ප්‍රතිපාදනය අඩු කරන ලදි. එය, 2020 දී රු. 3,000,000ක් වූ අතර 2023 දී 1,200,000 දක්වා අඩු කරන ලදි.




මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තා

# 2022 සහ 2023 අතර කාලය තුළ බදු ප්‍රතිපත්තියෙහි වෙනස් වීම්

## පුද්ගල ආදායම් බද්දට සිදු කරන ලද වෙනස්කම්

- පුද්ගල ආදායම් බදු අනුපාත **6%,12% 18%, 24%, 30%** සහ **36%** දක්වා ඉහළ නැංවීම
- උපරිම ආදායම් බදු අනුපාතය **18%** සිට **36%** දක්වා ඉහළ නැංවීම
- බද්දෙන් නිදහස් කිරීමේ සීමාව වසරකට රු. මිලියන **3** සිට රු. **1,200,000** දක්වා සංශෝධනය කිරීම

## වැට් බද්දට සිදු කරන ලද වෙනස්කම්

- වැට් බද්ද සඳහා ලියාපදිංචි වීමේ සීමාව වසරකට රු. මිලියන **300** සිට රු. මිලියන **80** දක්වා අඩු කිරීම
- වැට් බදු අනුපාතය **12%** සිට **15%** දක්වා ඉහළ නැංවීම
- ඇතැම් බදු නිදහස් කිරීම් ඉවත් කරන ලදි (උදා:- සංචාරක කර්මාන්තය මත වැට් බදුවලින් නිදහස් කිරීම)

## වෙනත් බදුවලට සිදු කරන ලද වෙනස්කම්

- 2023 වසර වන විට මධ්‍යසාර හා දුම්කොළ නිෂ්පාදන මත සුරාබද්ද 20% කින් ඉහළ නැංවීම

## සාංගමික ආදායම් බද්දට සිදු කරන ලද වෙනස්කම්

- සාංගමික ආදායම් බදු අනුපාතය **24%** සිට **30%** දක්වා ඉහළ නැංවීම
- සාංගමික ආදායම් බදුවලින් නිදහස් කිරීම් ඉවත් කිරීම

## බදු අහෝසි කිරීම

- ආර්ථික සේවා ගාස්තුව අහෝසි කිරීම


## බදු අලුතින් හඳුන්වා දීම/නැවත බලාත්මක කිරීම

- සමාජ සුරක්ෂිතතා දායකත්ව අයබද්ද හඳුන්වා දීම
- රඳවා ගැනීමේ බද්ද සහ අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද (APIT) ඉවත් කොට ඒ වෙනුවට උපයන විට ගෙවීමේ බද්ද නැවත හඳුන්වා දීම.
- රඳවා ගැනීමේ බද්දෙන් නිදහස් කිරීමේ සීමා ඉහළ නංවන ලදි.
- දේපල බදු ක්‍රමය සංශෝධනය කිරීම හා 2025 වන විට ක්‍රියාත්මක 'ධන බද්දක්' හඳුන්වා දීම.
- 2025 වන විට ක්‍රියාත්මක වන පරිදි ත්‍යාග හා බූදල් බද්දක් හඳුන්වා දීම.
- 2023 වන විට ඉන්ධන බද්දක් හඳුන්වා දීම
- 2025 වන විට සුරාබදු ස්වංක්‍රීයව උද්ධමනය වෙත යොමු කිරීමේ ක්‍රමයක් හඳුන්වා දීම.

මූලාශ්‍රය: ජා.මූ.අ. ශ්‍රී ලංකාව සඳහා වන වාර්තාව - මාර්තු 2023 | ශ්‍රී ලංකා මහ බැංකුව

All Rights Reserved © 2023
Verité Research

# 2019 සිට 2021 දක්වා කාලය තුළ ලියාපදිංචි වූ මුළු බදු ගෙවන්නන් සංඛ්‍යාව 70%කින් පහත බැසීම හේතුවෙන් එම කාල පරිච්ඡේදය තුළ 38.3%ක අලාභයක් සිදු විය




මූලාශ්‍ර: දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ 2021 හා 2022 වාර්ෂික කාර්යසාධන වාර්තා | වසර කිහිපයක් තුළ ශ්‍රී ලංකාවේ දේශීය ආදායම් ප්‍රතිපත්ති වෙනස්වීම්, http://www.ird.gov.lk/en/about%20IRD/SitePages/Policy%20Changes.aspx?menuid=110406

All Rights Reserved © 2023
Verité Research

## අධික බදු සහන ලබා දීමෙන් ආදායම් එක්රැස් කර ගැනීම වෙත සෘණාත්මක බලපෑම් එල්ල වේ.
## උදා:- ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත.

### ලබා දිය හැකි නිදහස් කිරීම්

1. දේශීය ආදායම් පනත
2. එකතු කළ අගය මත බදු පනත
3. 2002 අංක 11 දරන මුදල් පනත
4. 2005 අංක 5 දරන මුදල් පනත
5. සුරාබදු (විශේෂ විධිවිධාන) පනත
6. ආර්ථික සේවා ගාස්තු පනත
7. ණය බදු පනත
8. රේගු ආඥාපනත (235 පරිච්ඡේදය)
9. ජාතිය ගොඩනැගීමේ බදු පනත
10. වරාය හා ගුවන්තොටුපල සංවර්ධන අයබදු පනත
11. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත
12. ඔට්ටු ඇල්ලීමේ හා සූදු ක්‍රීඩා අයබදු පනත

### නිදහස් කිරීමේ උපරිම සහන කාල සීමාව

**වසර 25**

### නිදහස් කිරීමේ සහන අනුමත කිරීම

**කැබිනට් මණ්ඩලය හා පාර්ලිමේන්තුව**

ක්‍රමෝපාය සංවර්ධන පනත යටතේ **ඇ.ඩො. බිලියන 4ට*** වඩා වැඩි වටිනාකමක් සහිත ආයෝජන සඳහා බදු සහන රැසක් ලබා දෙන ලදි

සටහන: ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ බදු සහන ලබා දුන් ආයෝජනයන්හි වටිනාකම ප්‍රමාණනය කිරීමට ඇතැම් ගැසට් නිවේදන අපොහොසත් වීම හේතුවෙන් එකී ආයෝජනවල මුළු වටිනාකම, වාර්තා කර ඇති වටිනාකමට වඩා වැඩි වීමට ඉඩ ඇත.

All Rights Reserved © 2023
Verité Research

# බදු සහන හේතුවෙන් අහිමි වූ ආදායම ගණනය කර හෝ වාර්තා කර නොමැත

22.09.2022

Revenue Monitoring Unit

Information Officer (IRD),

Legal Branch.

**Order of the Right to Information Commission**

**Verite Research (Pvt) Ltd**

This refers to the letter dated 26.08.2022 on the above matter.

Inland Revenue Department does not maintain sector wise quarterly revenue data. Therefore, following sector wise annual revenue data is provided herewith.

1. Tourism Industry Revenue – Income Tax, VAT, NBT & ESC
2. Apparels and Textiles Industry Revenue – Income Tax, VAT, NBT & ESC

According to the statutory provisions, the exemptions and concessions, which were granted to the various sectors are being changed time to time. Therefore, number of companies, individuals and other entities benefiting from the exemptions and concessions cannot be identified separately.

The amount of tax revenue lost due to the said exemptions and concessions is not calculated by the Inland Revenue Department. Therefore, requested information cannot be provided.

Commissioner

Revenue Monitoring Unit

ව්‍යවස්ථාපිත විධිවිධානවලට අනුව, විවිධ අංශ සඳහා ලබා දුන් බදු සහන හා බදුවලින් නිදහස් කිරීම් කලින් කලට වෙනස් වේ. මේ නිසා, බදු සහන හා බදුවලින් නිදහස් කිරීම්වලින් ප්‍රතිලාභ ලබන සමාගම්, තනි පුද්ගලයන් හා අනෙකුත් ආයතන සංඛ්‍යාව වෙන වෙනම හඳුනා ගත නොහැක.

එකී බදු සහන හා බදුවලින් නිදහස් කිරීම් හේතුවෙන් බදු ආදායමට සිදු වූ අලාභයෙහි වටිනාකම දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ගණනය කර නොමැත. එම නිසා, ඉල්ලුම් කර ඇති තොරතුරු ලබා දීමේ හැකියාවක් නොමැත.

තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම යටතේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලද තොරතුරු ඉල්ලීමකට ලැබුණු ප්‍රතිචාරයෙන් හෙළිදරව් වූයේ **බදු සහන ලබා දීම හේතුවෙන් ආදායම් අලාභයෙහි වටිනාකම ගණනය කර නොමැති බව ය!**


All Rights Reserved © 2023
Verité Research

# 3. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල් වැඩසටහන
# සහ
# ආදායම් උත්පාදන යෝජනා

All Rights Reserved © 2023
Verité Research

# ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට ඇති බැඳියාවන්ට අදාළව ශ්‍රී ලංකාවේ කාර්යසාධනය (2023 ජූලි මාසය වන විට)

**IMF වැඩසටහනේ සමස්ත ප්‍රගතිය**




- **2023** මාර්තු මාසය වන විට බදු ආදායම දළ දේශීය නිෂ්පාදිතයෙන් **2.1%** (රු. බිලියන **650**) දක්වා ඉහළ නැංවීම
- මූල්‍ය විනිවිදභාවය සඳහා මාර්ගගත වේදිකාවක් නිර්මාණය කිරීම
- තෝරා ගත් බැංකුවල වත්කම් ගුණාත්මකතා සමාලෝචනය සම්පූර්ණ කිරීම
- ඔට්ටු ඇල්ලීමේ හා සූදු ක්‍රීඩා අයබදු ඉහළ නැංවීම
- ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායයන් ප්‍රතිව්‍යුහගත කිරීමේ සැලැස්මට කැබිනට් අනුමැතිය ලබා ගැනීම
- ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායයන් **52** හි ම **2022** වසර සඳහා වූ වාර්ෂික වාර්තා ප්‍රකාශයට පත් කිරීම
- ආනයන සීමා ඉවත් කිරීම සඳහා සැලැස්මක් සකස් කිරීම
- **2024** වසර සඳහා වන ආදායම් විධිවිධාන සඳහා කැබිනට් අනුමැතිය ලබා ගැනීම

සටහන: මෙහි "අවිනිශ්චිත" යන්නෙන් අදහස් වන්නේ ඉලක්ක සාක්ෂාත් කර ගෙන තිබේද යන්න නිවැරදිව තක්සේරු කිරීම අසීරු කරමින් තහවුරු කළ හැකි තොරතුරු ප්‍රසිද්ධියේ ලබා ගැනීමට හැකියාවක් නොමැති බැඳියාවන් වේ.

මූලාශ්‍ර: ජා.මූ.අ. සහ ශ්‍රී ලංකාව "Request For An Extended Arrangement Under The Extended Fund Facility—press Release; Staff Report; And Statement By The Executive Director For Sri Lanka"

All Rights Reserved © 2023
Verité Research

# ජාත්‍යන්තර මූල්‍ය අරමුදල් වැඩසටහනේ ඉදිරි කැපවීම්

| ආදායම කේන්ද්‍ර කර ගත් වැඩසටහන් කැපවීම් | සම්පූර්ණ කළ යුතු දිනය | තත්ත්වය |
|---|---|---|
| | ජන-23 | ඉටු කර ඇත |
| සේවා ගෙවීම් මත 5%ක රඳවා ගැනීමේ බද්දක් අය කිරීම | ජන-23 | ඉටු කර ඇත |
| ලාභාංශ හැර අන් සියලුම ගෙවීම් මත අවසන් නොවන රඳවා ගැනීමේ බද්දක් අය කිරීම | ජන-23 | ඉටු කර ඇත |
| ලාභාංශ මත අවසන් රඳවා ගැනීමේ බද්දක් අය කිරීම | ජන-23 | ඉටු කර ඇත |
| සභාධිපත්‍ය පදිංචි මහල් නිවාස වැට් බදුවලින් නිදහස් කිරීම ඉවත් කිරීම | ජන-23 | ඉටු කර ඇත |
| පුද්ගල ආදායම් බදු ව්‍යුහය සමාලෝචනය කිරීම | ජන-23 | ඉටු කර ඇත |
| දුම්කොළ හා මධ්‍යසාර නිෂ්පාදන මත සුරාබදු 20%කින් ඉහළ නැංවීම | ජන-23 | ඉටු කර ඇත |
| 2023 මාර්තු මාසය වන විට බදු ආදායම ද.දේ.නි. හි 2.1%ක් (රු. බි. 650) දක්වා ඉහළ නැංවීම | මාර්තු-23 | ඉටු කර නැත |
| ඔට්ටු හා සූදු අයබදු ඉහළ නැංවීම | අප්‍රේල්-23 | ඉටු කර නැත |
| 2023 ජූනි මාසය වන විට බදු ආදායම ද.දේ.නි. හි 4.3%ක් (රු. බි. 1,300) දක්වා ඉහළ නැංවීම | ජූනි-23 | නොදනී |
| දුම්කොළ හා මධ්‍යසාර නිෂ්පාදන මත සුරාබදු ඉහළ නැංවීමේ අවශ්‍යතාව සමාලෝචනය කිරීම | ජූනි-23 | ඉටු කර ඇත |
| වැඩසටහන් පරාමිතිකවලට අනුකූල වන පරිදි 2024 වසර තුළදී මුදල් එක්රැස් කිරීමට උපකාරී වන ආදායම් විධිවිධාන සඳහා කැබිනට් අනුමැතිය ලබා ගැනීම | ජූනි-23 | ඉටු කර නැත |
| 2023 සැප්තැම්බර් මාසය වන විට බදු ආදායම ද.දේ.නි. හි 6.9%ක් (රු. බි. 2,100) දක්වා ඉහළ නැංවීම | සැප්-23 | ඉටු කළ යුතුව ඇත |
| 2023 දෙසැම්බර් මාසය වන විට බදු ආදායම ද.දේ.නි. හි 9.7%ක් (රු. බි. 2,940) දක්වා ඉහළ නැංවීම | දෙසැ-23 | ඉටු කළ යුතුව ඇත |
| රාජ්‍ය මූල්‍ය කළමනාකරණ නීති කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම | දෙසැ-23 | ඉටු කළ යුතුව ඇත |

මූලාශ්‍රය: ජා.මූ.අ. සහ ශ්‍රී ලංකාව "Request For An Extended Arrangement Under The Extended Fund Facility—Press Release; Staff Report; And Statement By The Executive Director For Sri Lanka"

All Rights Reserved © 2023
Verité Research

# ස්තුතියි!